# 12. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශන අවසර පත්‍ර නිකුත් කිරීම - ගැලීම් සටහන

| | |
|---|---|
| ඩිජිටල්කරණ දත්ත භාවිත කිරීම | ඉලෙක්ට්‍රොනික පණිවුඩ / ගනුදෙනු (SMS / WhatsApp / e-mail) |

අන්තර්ජාලය ඔස්සේ හෝ පැමිණ ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය සඳහා වන ඉල්ලුම් පත්‍රය ලබා ගෙන, අදාළ ඇමුණුම් ද සමග සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය අන්තර්ජාලය ඔස්සේ හෝ පෙරටු කාර්යාලයට පැමිණ භාර දීම

වගකීම: ඉල්ලුම්කරු

↓

ඉල්ලීම, අතුරු ව්‍යවස්ථාවේ නියම සමග සැසඳෙන්නේ ද යන්න පරීක්ෂා කර බලා ඉල්ලුම්කරුට පසු විපරම් අංකයක් නිකුත් කිරීම

වගකීම: පෙරටු කාර්යාල නිලධාරි

↓

අය කර ගත යුතු ගාස්තුව පිළිබඳ නිර්දේශ ලබා ගැනීමට ඉල්ලුම් පත්‍රය ආදායම් පරීක්ෂකට යොමු කිරීම

වගකීම: පෙරටු කාර්යාල නිලධාරි

↓

අතුරු ව්‍යවස්ථාවේ නියමවලට අනුගත වීම පරීක්ෂා කර බලා අය කර ගත යුතු ගාස්තුව පිළිබඳ නිර්දේශ විෂය භාර නිලධාරි මගින් නාගරික කොමසාරිස් / ලේකම් වෙත යොමු කිරීම

වගකීම: ආදායම් පරීක්ෂක

↓

අවසර පත්‍රය නිකුත් කිරීම පිළිබඳ නිර්දේශය අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ තීරණය විෂය භාර නිලධාරි වෙත නිකුත් කිරීම

වගකීම: නාගරික කොමසාරිස් / ලේකම්

↓

ඉල්ලීම අනුමත කර තිබේ ද?

**ඔව්**

අවසර පත්‍රය සකස් කර නාගරික කොමසාරිස්ගේ / ලේකම්ගේ අත්සන ලබා ගෙන පෙරටු කාර්යාලයට යොමු කර ගෙවිය යුතු මුදල ඉල්ලුම්කරුට දැන්වීම

වගකීම: විෂය භාර නිලධාරි

↓

අන්තර්ජාලය ඔස්සේ හෝ පැමිණ ගාස්තුව ගෙවා අවසර පත්‍රය ලබා ගැනීම

වගකීම: ඉල්ලුම්කරු

↓

මුදල් අය කර ගෙන අවසර පත්‍රය හා ලදුපත නිකුත් කිරීම සහ වටිනාකම ආදායම් ශීර්ෂයට බැර කර ලේඛන යාවත්කාලීන කිරීම

වගකීම: පෙරටු කාර්යාල නිලධාරි

**නැත**

හේතු පැහැදිලි කරමින් ඉල්ලීම ප්‍රතික්ෂේප කළ බව ඉල්ලුම්කරුට දැන්වීම

වගකීම: විෂය භාර නිලධාරි

↓

ප්‍රතික්ෂේප කර ඇත්තේ අඩුපාඩු මත නම්, ඒවා නිවැරදි කර නැවත වාර්තා කිරීම

වගකීම: ඉල්ලුම්කරු

(→ ආදායම් පරීක්ෂකට යොමු කිරීමේ පියවරට නැවත)

කාර්යසාධක දර්ශකය



# 12. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශන අවසර පත්‍ර නිකුත් කිරීම

## 1. හැඳින්වීම

(අ) යම් ප්‍රසිද්ධ ස්ථානයක සිට බැලූ විට පෙනෙන පරිදි, මහජනතාව වෙත කිසියම් පණිවුඩ සන්නිවේදනය කිරීමක් සඳහා පුවරුවක හෝ බැනරයක ආධාරයෙන් ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම්වලින් දෘශ්‍ය පරිසරයට සිදු විය හැකි බාධා හෝ හානි වළක්වාලීමේ අරමුණ ඇතිව ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම නියාමනය කිරීමට පළාත් පාලන ආයතන විසින් අතුරු ව්‍යවස්ථා සාදනු ලැබ ඇත.

(ආ) දැන්වීමක් හෝ පණිවුඩයක් හෝ තැනැත්තන් වෙත සන්නිවේදනය කිරීම සඳහා රූප හෝ වචන හෝ වෙනත් කවර හෝ ආකාරයක සංඥා හෝ යොදා ගනිමින් කවර වූ හෝ පොදු ස්ථානයක සිට බැලූ විට පෙනෙන පරිදි කිසියම් තැනක සවි කරන ලද හෝ එල්ලා තබන ලද හෝ අලවා තබන ලද නැතහොත් ප්‍රදීප්ත පුවරුවක් වශයෙන් ප්‍රදර්ශනය කරනු ලබන, මුද්‍රණය කරන ලද හෝ අතින් අඳින ලද හෝ විද්‍යුත් හෝ වෙනත් ආකාරයක ආලෝක සංඥා හෝ වෙනත් කවර හෝ ආකාරයකින් ප්‍රදර්ශනය කරනු ලබන සන්නිවේදනයක් ප්‍රචාරක දැන්වීමක් වශයෙන් හඳුන්වනු ලැබේ.

(ඇ) "පොදු ස්ථානය" යන්නට, යම් වීදියක්, පාරක්, ඇලක්, වැවක්, මුහුද, අහස හෝ රජයට හෝ පළාත් පාලන ආයතනයට අයත් කිසියම් ස්ථානයක හෝ මහජනතාව පරිහරණය කරනු ලබන යම් වෙනත් පොදු ස්ථානයක් අදහස් වේ.

(ඈ) ඉහත කී කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීමක් සහ එය ප්‍රදර්ශනය කරන ස්ථානය, අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අනුගමනය කර තිබෙන බවට පළාත් පාලන ආයතනය විසින් නිකුත් කරනු ලබන සහතිකය, මේ කාර්යයේ දී "අවසර පත්‍රය" යනුවෙන් අදහස් වේ.

සටහන: 1. පහත දැක්වෙන යම් කාරණයකට අදාළ ව ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු ගෙවීමේ සහ අවසර පත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවෙන් නිදහස් වේ.

ප්‍රතිදීප්ත ප්‍රචාරක දැන්වීමක් හෝ ගුවන් පුවරුවක් නොවන -

(අ) "කුලියට දීමට තිබේ" යන්න හෝ "විකිණීමට තිබේ" යනුවෙන් වූ ප්‍රචාරක දැන්වීමක්;

(ආ) ගෘහ නාම පුවරු හෝ වර්ග මීටර් 0.093 (වර්ග අඩි 1) නො ඉක්මවන වෘත්තිය කටයුත්තකට අදාළ දැන්වීමක්;

(ඇ) වෙළෙඳ කටයුත්තක් සඳහා යොදා ගන්නා වාහනයක ප්‍රදර්ශනය කරනු ලබන ඒ ව්‍යාපාරයේ ස්වභාවය, අයිතිකරුගේ නම, ලිපිනය හා දුරකථන අංක දැක්වෙන ප්‍රචාරක දැන්වීමක්.

2. පහත දැක්වෙන යම් කාරණයකට අදාළ ව ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අය කිරීමේ අවශ්‍යතාවෙන් නිදහස් වන නමුත් අවසර පත්‍රයක් ලබා ගැනීමට යටත් විය යුතු ය.

ප්‍රතිදීප්ත ප්‍රචාරක දැන්වීමක් හෝ ගුවන් පුවරුවක් නොවන -

(අ) ශුද්ධ ලාභය පුණ්‍ය කටයුත්තක් සඳහා යොදවන යම් ප්‍රසංගයක දැන්වීමක්;

(ආ) කිසියම් ප්‍රසංගයක් පවත්වන ස්ථානයේ සවි කරනු ලබන ඒ ප්‍රසංගයට අදාළ ප්‍රචාරක දැන්වීමක්;

(ඇ) ආගමික, දේශපාලනික හෝ මහජන රැස්වීමක් පිළිබඳ දැන්වීමක්

3. කිසියම් ප්‍රචාරණ කාර්යයක් සඳහා ප්‍රදර්ශනය කරන පෝස්ටර් සඳහා අවසර පත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාවෙන් නිදහස් වන නමුත් එවැනි යම් පෝස්ටරයක්, ඇලවීම සඳහා වෙන් කර ඇති ස්ථානයක හැර වෙනත් ස්ථානයක අලවා තැබීම වරදක් වේ.

## 2. නීතිමය අධිකාරය

කිසියම් පළාත් පාලන ආයතනයකට ලැබී ඇති බලය යටතේ සාදන ලද හෝ ඒ යටතේ සාදන ලදැයි සලකනු ලබන, ප්‍රචාරක දැන්වීම් හා දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථා.

**3. ගාස්තු**

අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ පළාත් පාලන ආයතනය විසින් කලින් කල තීරණය කරනු ලැබ, ඒ පිළිබඳ ව ගැසට් පත්‍රයේ නිවේදනය කරනු ලබන ප්‍රමාණයේ ගාස්තුවක් ගෙවිය යුතු ය.

**4. ඉදිරිපත් කළ යුතු ලේඛන**

(අ) මෙහි උප ලේඛනයේ දැක්වෙන ආකෘතියට අනුව පිළියෙළ කර නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය

(ආ) A 4 ප්‍රමාණයේ කඩදාසියක මුද්‍රණය කරන ලද හෝ අතින් අඳින ලද (යොදා ගන්නා වර්ණ ද පෙන්නුම් කරන), ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන ප්‍රචාරක දැන්වීමෙහි සමරූපී ආදර්ශයක්;

(ඇ) කිසියම් මාර්ගයක රක්ෂිතයේ සවි කර ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් පුවරුවක් වන විට අදාළ වන පරිදි ඒ මාර්ගයේ අයිතිය ඇති මාර්ග සංවර්ධන අධිකාරිය හෝ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය හෝ පළාත් පාලන ආයතනය විසින් ඒ සඳහා දෙන ලද අවසරය;

(ඈ) අදාළ ප්‍රචාරක දැන්වීම් පුවරුව ප්‍රදර්ශනය කරන ස්ථානය අයත් වන පොලිස් ස්ථානයේ රථ වාහන අංශය විසින් එකඟතාව පළ කළ ලිපියේ පිටපතක් ඉදිරිපත් කල යුතු ය.

(ඉ) කිසියම් පෞද්ගලික ඉඩමක හෝ ගොඩනැගිල්ලක සවි කරනු ලබන හෝ ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීමක් වන විට, ඒ ඉඩමේ හෝ ගොඩනැගිල්ලේ අයිතිකරු හෝ අයිතිකරුවන් විසින් ඒ සඳහා ඉඩ දීමට කැමැත්ත ප්‍රකාශිත ලිපියේ පිටපතක්.

සටහන: සභාවේ වෙබ් අඩවිය ඔස්සේ හෝ පෙරටු කාර්යාලයට පැමිණ ඉල්ලුම් පත්‍රය ලබා ගැනීම හා භාර දීම කළ හැකි ය.

**5. පටිපාටිය**

| පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|
| අන්තර්ජාලය ඔස්සේ හෝ පෙරටු කාර්යාලයට පැමිණ ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය සඳහා වන ඉල්ලුම් පත්‍රය ලබා ගැනීම | | ඉල්ලුම්කරු |
| අදාළ ඇමුණුම් ද සමඟ සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය, අන්තර්ජාලය ඔස්සේ හෝ පෙරටු කාර්යාලයට පැමිණ භාර දීම | ප්‍රචාරක දැන්වීම ස්ථාපිත කිරීමට දින 7 කට පෙර | ඉල්ලුම්කරු |
| ඉල්ලීම, අතුරු ව්‍යවස්ථාවේ නියම සමග සැසඳෙන්නේ ද යන්න පරීක්ෂා කර බලා ඉල්ලුම්කරුට පසු විපරම් අංකයක් නිකුත් කිරීම | ඉල්ලුම් පත්‍රය භාර ගත් වහාම | පෙරටු කාර්යාල නිලධාරි |
| ඉල්ලීම, අතුරු ව්‍යවස්ථාවේ නියම සමග සැසඳෙන්නේ ද යන්න පරීක්ෂා කර බලා අය කර ගත යුතු ගාස්තුව පිළිබඳ නිර්දේශ ලබා ගැනීමට ආදායම් පරීක්ෂකට යොමු කිරීම | ඉල්ලුම් පත්‍රය භාර ගත් අවස්ථාවේ දී ම | පෙරටු කාර්යාල නිලධාරි |
| අතුරු ව්‍යවස්ථාවේ නියමවලට අනුගත වීම පරීක්ෂා කර බලා අය කර ගත යුතු අවසර පත්‍ර ගාස්තුව පිළිබඳ නිර්දේශය විෂය භාර නිලධාරි මගින් නාගරික කොමසාරිස් / ලේකම් වෙත යොමු කිරීම | ඉල්ලුම් පත්‍රය තමන් වෙත ලැබුණු වහාම | ආදායම් පරීක්ෂක |
| අවසර පත්‍රය නිකුත් කිරීම පිළිබඳ නිර්දේශය අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ තීරණය විෂය භාර නිලධාරි වෙත නිකුත් කිරීම | නිර්දේශිත ඉල්ලුම් පත්‍රය තමන් වෙත ලැබුණු දින ම | නාගරික කොමසාරිස් / ලේකම් |

| පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|
| ඉල්ලීම අනුමත කර ඇත්නම්, අදාළ අවසර පත්‍රය සකස් කර නාගරික කොමසාරිස්ගේ / ලේකම්ගේ අත්සන ලබා ගෙන පෙරටු කාර්යාලයට යොමු කර ගෙවිය යුතු මුදල ඉල්ලුම්කරුට දැනුම් දීම | අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ නියෝගය තමන් වෙත ලැබුණු දින | විෂය භාර නිලධාරි |
| අන්තර්ජාලය ඔස්සේ හෝ පැමිණ අදාළ ගාස්තුව ගෙවා අවසර පත්‍රය ලබා ගැනීම | | ඉල්ලුම්කරු |
| මුදල අය කර ගෙන අවසර පත්‍රය සහ ලදුපත නිකුත් කිරීම සහ වටිනාකම ආදායම් ශීර්ෂයට බැර කර ලේඛන යාවත්කාලීන කිරීම | මුදල අය කර ගත් වහාම | පෙරටු කාර්යාල නිලධාරි |

සටහන: ප්‍රචාරක දැන්වීම් පුවරු ස්ථාන ගත කිරීමේ දී හා නඩත්තු කිරීමේ දී පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතු ය.

(අ) සියලු ම ප්‍රචාරක දැන්වීම් පුවරුවල අවසර පත්‍ර අංකය සහ අවසර පත්‍රය නිකුත් කළ දිනය සටහන් කර තිබිය යුතු ය.

(ආ) අවසර පත්‍ර හිමියාගේ නම සහ දුරකථන අංකය ප්‍රචාරක දැන්වීමේ පැහැදිලිව සඳහන් විය යුතු ය.

(ඇ) ප්‍රචාරක දැන්වීම මගින් බාහිර පාර්ශවයකට සිදු විය හැකි අනතුරු ඇති වීම වළක්වාලීමට අවශ්‍ය වැඩ පිළිවෙළ යෙදිය යුතු ය.

(ඈ) රියදුරන්ගේ අවධානයට බාධා නොවන පරිදි ප්‍රචාරක දැන්වීම් ස්ථාන ගත කළ යුතු ය. උදා: මාර්ග හරහා බැනර ප්‍රදර්ශනය නො කල යුතු අතර රියදුරන්ගේ මාර්ග අවධානයට සිදු විය හැකි බාධා වැළැක්වීය යුතු ය.

(ඉ) නාගරික කොමසාරිස් / ලේකම් විසින් විශේෂයෙන් කරනු ලැබූ නියම කිසිවක් වේ නම්, ඒවා පිළිපැදිය යුතු ය.

ඇමුණුම

**. . . . . . . . . . . . . . . . . . සභාව**

## දැන්වීම් පුවරු / බැනර ප්‍රදර්ශනය සඳහා අවසර ලබාගැනීමේ ඉල්ලුම් පත්‍රය.

1. පෞද්ගලික තොරතුරු.

(අ) ඉල්ලුම්කරුගේ නම : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

(ආ) හැඳුනුම්පත් අංකය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

(ඇ) ජංගම දූරකථන අංකය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

(ඈ) කාර්යාලයීය දූරකථන අංකය : . . . . . . . . . . . . . . . . . . . . . . ෆැක්ස්: . . . . . . . . . . . . . . . . . . . . .

(ඇ) ඊ - මේල් ලිපිනය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

(ඉ) තැපැල් ලිපිනය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. (අ) ඉල්ලුම්කරු නො පැමිණෙන්නේ නම් නියෝජිතයාගේ නම සහ ලිපිනය: . . . . . . . . . . . . . . . . . . . . . . . . .
. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

(ආ) හැඳුනුම්පත් අංකය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

(ඇ) දූරකථන අංකය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3. සවි කිරීමට අදාළ දැන්වීම් පුවරුව / බැනරය මගින් කෙරෙන ප්‍රචාරණය:

ආගමික කටයුත්තක් / සංගීත ප්‍රසංගයක් හෝ වෙනත් විනෝද කාර්යයක් / අධ්‍යාපනික කටයුත්තක් / වෙළෙඳ ප්‍රචාරණයක් / වෙනත් (කාර්යය සඳහන් කරන්න) . . . . . . . . . . . . . . . . . . . . . . . . . (දැන්වීමේ ආදර්ශ ආකෘතියක් A4 ප්‍රමාණයේ කඩදාසියකට ඇතුළත් වන පරිදි සකස් කොට ඉල්ලුම් පත්‍රයට අමුණන්න)

4. දැන්වීම් පුවරුවේ / බැනරයේ ප්‍රමාණය: දිග: සෙ. මී. . . . . . . . . . . . . . පළල: සෙ. මී. . . . . . . . . . . . .

5. ප්‍රදර්ශනය කිරීමට අපේක්ෂා කරන දැන්වීම් / බැනර සංඛ්‍යාව: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

6. දැන්වීම් / බැනර ප්‍රදර්ශනය කරන ස්ථාන පිළිබඳ තොරතුරු: (සපයා ඇති ඉඩ ප්‍රමාණවත් නො වන්නේ නම් වෙනම කඩදාසියක මේ තොරතුරු ඇතුළත් කරන්න. ඒ කඩදාසිය අවසානයේ ඉල්ලුම්කරු විසින් ස්වකීය අත්සන යොදා තිබිය යුතු ය.)

| අනු අංක | දැන්වීම් / බැනර සවි කරන ස්ථානය | දැන්වීම් / බැනර සවි කරන ස්ථානයේ | | |
|---|---|---|---|---|
| | | අයිතිකරු | අයිතිකරු ගේ ලිපිනය | දූරකථන අංකය |
| 01. | | | | |
| 02. | | | | |
| 03. | | | | |
| 04. | | | | |

(දැන්වීම් / බැනර ප්‍රදර්ශනය කරන ඉඩමේ හෝ ගොඩනැගිල්ලේ නීත්‍යානුකූල අයිතිය ඇති තැනැත්තාගෙන් හෝ තැනැත්තන්ගෙන් ලබාගත් පූර්ව ලිඛිත අනුමතය ලබාගත් ලිපියක් ඉල්ලුම් පත්‍රයට අමුණා තිබිය යුතු ය. කිසියම් ස්ථානයක ස්වාභාවික සෞන්දර්ය දර්ශනයට හෝ ඒ ස්ථානය ඔස්සේ ගමන් ගන්නා වාහනවල රියදුරන්ගේ අවධානයට හෝ ආරක්ෂාවට බාධා ඇති වන බවට පළාත් පාලන ආයතනය අදහස් කරන ස්ථානයක් වන විට ඉහත නම් කර ඇති යම් ස්ථානයක දැන්වීම් / බැනර සවි කිරීමට අවසර දෙනු නො ලැබේ. අනුමතය ඉල්ලා ඇති ස්ථානවල හැර වෙනත් ස්ථානයක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම හෝ ඉල්ලා ඇති සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් දැන්වීම් ප්‍රදර්ශනය කර ඇති විට, අධිකරණ ක්‍රියාමාර්ගවලට යටත් වනු ඇත)

7. දැන්වීම් / බැනර ප්‍රදර්ශනය කිරීමට අපේක්ෂා කරන කාලය: 20 . . . . . . . . . . . . . සිට 20 . . . . . . . . . . . . .

8. දැන්වීම්/ බැනර ප්‍රදර්ශනය කිරීමට අපේක්ෂා කරන කාලය 20..................සිට 20........................................

පසු පිටෙහි සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රය මත අනුමතය දී ඇති කාලය අවසන් වන දිනයේ දී සියලු දැන්වීම් පුවරු / බැනර, ඒවා සවි කර ඇති ස්ථානවලින් ඉවත් කර ගැනීමටත්, නැතහොත් සභාව විසින් ඒවා ඉවත් කිරීමට වැය වන ගාස්තුව ගෙවීමටත් පොරොන්දු වෙමි. මේ දැන්වීම් පුවරු / බැනර සවි කර ඇති ඉඩමේ හෝ ගොඩනැගිල්ලේ අයිතිකරු විසින් හෝ වෙනත් යම් පාර්ශවයක් විසින් ඒවා ඉවත් කිරීම හෝ විකෘති කිරීම හෝ ඒවාට හානි කිරීම හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ඒ දැන්වීම් පුවරු / බැනර ප්‍රදර්ශනය කිරීම වළක්වන ක්‍රියාවක් පිළිබඳ ව සභාව වගකීමට බැඳී නොමැති බවත් සහ මේ දැන්වීම් පුවරුවලින් / බැනරවලින් යම් පාර්ශවයකට සිදු වන හානි සම්බන්ධයෙන් වන සියලු වගකීම් මා විසින් භාර ගනු ලබන බවත්, ඒ සඳහා සභාව විසින් නිකුත් කළ අවසරය මගින් මා වෙත හිමිකමක් නො ලැබෙන බවත් පිළිගනිමි. දැන්වීම් පුවරු / බැනර ප්‍රදර්ශන ගාස්තු අය කර, දැන්වීම් පුවරු / බැනර ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

දිනය: 20 . . . . . . . . . . . . . . . .                                    . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

ඉල්ලුම්කරුගේ අත්සන.

---

**කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා.**

ආදායම් පරීක්ෂක,

ඉහත ඉල්ලීම, ප්‍රචාරක දැන්වීම් හා දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවලට අනුව අය කල යුතු ගාස්තු පරීක්ෂා කර බලා, ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ සමග නාගරික කොමසාරිස් / ලේකම් වෙත ඉදිරිපත් කිරීම සඳහා යොමු කරමි.

දිනය: 20 . . . . . . . . . . . . . . . .                                    . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

පෙරටු කාර්යාල නිලධාරි

---

නාගරික කොමසාරිස් / ලේකම්,

ඉහත ඉල්ලුම් පත්‍රයේ 6 ඡේදයේ සඳහන් කර ඇති ස්ථානවල / අනු අංක . . . . . . . . . . . . . . . . . යන ස්ථානවල හැර * දැන්වීම් පුවරු / බැනර ප්‍රදර්ශනය සඳහා, පහත සඳහන් පරිදි ගාස්තු අය කර ගැනීම නිර්දේශ කරමි. / අතුරු ව්‍යවස්ථාවල නියමවලට පටහැනි බැවින් නිර්දේශ කළ නො හැක. *

| | |
|---|---|
| එක් දැන්වීම් පුවරුවක / බැනරයක වර්ග ඵලය | වර්ග මීටර් . . . . . . . . . . . . . . . . . . . . |
| එක් දැන්වීම් පුවරුවක් / බැනරයක් වෙනුවෙන් අය කළ යුතු ගාස්තුව | රුපියල් . . . . . . . . . . . . . . . . . . |
| දැන්වීම් පුවරු / බැනර ගණන | . . . . . . . . . . . . . |
| මුළු ගාස්තුව | රුපියල් . . . . . . . . . . . . . . . . . . |
| මුළු අය කිරීම | රුපියල් . . . . . . . . . . . . . . . . . . |
| රජය විසින් නියම කළ බදු (1) | රුපියල් . . . . . . . . . . . . . . . . . . |
| රජය විසින් නියම කළ බදු (2) | රුපියල් . . . . . . . . . . . . . . . . . . + |
| එකතුව | රුපියල් . . . . . . . . . . . . . . . . . . |

දිනය: 20 . . . . . . . . . . . . . . . . . .                                    . . . . . . . . . . . . . . . . . . .

ආදායම් පරීක්ෂක

විෂය භාර නිලධාරි,

* ඉහත නිර්දේශය අනුමත කරමි.
* අවසර පත්‍රය සකස් කොට මාගේ අත්සනට ඉදිරිපත් කරන්න.
* ඉහත ඉල්ලීම ප්‍රතික්ෂේප කරමි. ඒ බව දැනුම් දෙන ලිපිය මාගේ අත්සනට ඉදිරිපත් කරන්න.

දිනය: 20 . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . .
නාගරික කොමසාරිස් / ලේකම්

නාගරික කොමසාරිස් / ලේකම්,

* ඉහත නියෝගය අනුව අවසර පත්‍රය / ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලිපිය අත්සනට ඉදිරිපත් කරමි. *

දිනය: 20 . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . .
විෂය භාර නිලධාරි

---

විෂය භාර නිලධාරි,

ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමේ ලිපිය අත්සන් කළා. නිකුත් කරන්න. / අත්සන් කළ අවසර පත්‍රය පෙරටු කාර්යාලයට යොමු කරන්න.

දිනය: 20 . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . .
නාගරික කොමසාරිස් / ලේකම්

---

පෙරටු කාර්යාල නිලධාරි,

අත්සන් කළ අවසර පත්‍රය මේ සමග අමුණා ඇත. ගාස්තු අය කර ගෙන අවසර පත්‍රය නිකුත් කර, අය කිරීම් පිළිබඳ තොරතුරු සටහන් කර මෙම ඉල්ලුම් පත්‍රය ආපසු මා වෙත එවන්න.

දිනය: 20 . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . .
විෂය භාර නිලධාරි

---

විෂය භාර නිලධාරි,

අවසර පත්‍රය නිකුත් කළා. අදාළ ගාස්තු පහත පරිදි අය කර ගෙන ඇත.

| | |
|---|---|
| මුළු අය කිරීම | රුපියල් . . . . . . . . . . . . . . . . . . . |
| රජය විසින් නියම කළ බදු (1) | රුපියල් . . . . . . . . . . . . . . . . . . . |
| රජය විසින් නියම කළ බදු (1) | රුපියල් . . . . . . . . . . . . . . . . . . . + |
| එකතුව | රුපියල් . . . . . . . . . . . . . . . . . . . |

ලදුපතේ අංකය හා දිනය: . . . . . . . . . . . . . . . - 20 . . . . . . . . . . . . . . . .

දිනය: 20 . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . .
පෙරටු කාර්යාල නිලධාරි